// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1656/17 - 2010 මැයි 31 වැනි සඳුදා - 2010.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

නැගෙනහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩු පිරවීම

නැගෙනහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (1) වැනි වගන්තිය යටතේ නැගෙනහිර පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මවිසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස මොහමඩ් හනිෆා සේගු ඉස්මායිල් මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, මොහමඩ් හනිෆා සේගු ඉස්මායිල් මහතා එම පුරප්පාඩුව සිදු වූ මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත් වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 ක් වූ මැයි මස 25 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

06 - 277

1A - G 12904— 350 (2010/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.